# අපූරු මිතුදම



සෙනුලි ගෙහන්සා
වීරසිංහ

# අපුරු මිතුදම

## සෙනුලි ගෙහන්සා වීරසිංහ

කතෘගේ වෙනත් කෘති : මලිදුට පාඩමක් (2024)

(4 ශ්‍රේණිය)

මහ / මහාමායා බාලිකා විදුහල,

මහනුවර.

කෘතිය එළ කරන දිනය : 2025.02.08

**ISBN අංකය : 978-624-208-652-1**

# පිදුම

පොතක් ලිවිම කෙරෙහි මා හට උනන්දුවක් ඇති කළ මගේ
ආදරණීය දෙමාපියන්ටත්,
මගේ පොත  නිර්මාණයේදී මා හට සහයෝගය ලබා දුන්
මගේ අයියාටත් ,
මට “අ” යනු “ආ”යනු කියාදෙමින් මාව නිසි මගට යොමු
කරන මගේ මහාමායා විදුබිමේ
විදුහල්පතිතුමිය ප්‍රමුඛ
මගේ ආදරණීය ගුරු මව් පිය වරුන්ටත්,
මෙවන් අවස්ථාවක් ලබාදුන් මහාමායා බාලිකා විදුහලේ
“හෙරණගත්කරණී ” සංවිධායක කමිටුවේ ගුරු මව් පිය
වරුන්ටත්
මගේ මෙම කෘතිය පුද කරමි.

සෙනුලි ගෙහංසා වීරසිංහ .
මහාමායා බාලිකා  විදුහල,
මහනුවර.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වාර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුලින විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත කතුවරියන් සමත් වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයටද යොමුකරන **"හෙණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,

ශෂිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

ඔන්න එකොමත්

එක ගම්මානෙක පුංචි

පාසලක් තිබුනා. මේ පාසල කඳු

ගැටයක් අසල ලස්සන ගස් වැල්

වලින් පිරි වටපිටාවකට හිමිකම් කිවා.

මේ පාසලේ වැඩිපුරම හිටියේ හරිම

අහිංසක ළමයි.


SCHOOL

ඔය ළමයි අතරේ එක ළමයෙක් හිටියා.  එයා හරිම දුප්පත්. ඒ වගේම හරිම අහිංසකයි. එයාගේ නම පවනි. ඉතිං මෙයාට හරියට කන්න බොන්න, අඳින්න පළඳින්න වත් තිබුණේ නෑ. පවනි පාසලේ හිටියේ හරිම දුකින්. සමහර වෙලාවට මෙයා තමන්ගේ දුක පිට කලේ කඳුළු වලින්.


11
12
1
10
2
9
3
8
4
7
6
5

ඉතිං ඒ පාසලේම තවත් ළමයෙක් හිටියා ගයනි කියලා. ඉතිං කොහොම හරි ගයනි දැක්කා පවනි කන්න මුකුත් ගෙනල්ලා නෑ කියලා.

ඊට පස්සේ ගයනි පවනි ළගට ගිහිල්ලා තමන්ගේ කෑම එකෙන් බාගයක් පවනිට දුන්නා. ඉතින් දැන් පවනිට ගොඩක් සතුටුයි. මොකද ඉතින් පවනි හිටියේ උදේටත් හරි කෑමක් නැතිව, කහට කෝප්පයක් බිලා. ඒ නිසා පවනි හරිම බඩගින්නේ හිටියේ.

ඊට පස්සේ මේ දෙන්නම කාලා

පාඩම් කරන්න පටන් ගත්තා. ඉතිං

මේ පුංචි පවනිට කෑම විතරක්

නෙවෙයි ඇඳුම් පැළඳුම් වගේම පොත්

පත් වලින්ද බොහෝ අගහිඟකම්

තිබුණා. පවනිට පාඩම් කරන්න

පෑන් පැන්සල් , පොත් පත් වගේ

දේවලුත් අවශ්‍ය ප්‍රමාණයට තිබුනේ

නැහැ.



ඉතිං ගයනි එයා ලග තිබුණ පැන්
පැන්සල් වලින් කිහිපයක් පවනිට
දුන්නා. ගයනි පවනිට වැඩ කරන්න බඩු
දීලා ඒවගෙන් ලියන ගයනි දිහා බලලා
ගොඩක් සතුටු උනා. මේ විදිහට
පහුවදා දෙන්නම හරි සතුටින් පාඩම්
වැඩ කළා.ගයනි පවනිට තමන් ලග
වැඩිපුර තිබුන පොත් කිහිපයකුත්
ගෙනල්ලා දුන්නා.



ඔහොම දවස් ගෙවිලා ගියා. ගයනිගේ අම්මලත් ගයනි පවනිට උදව් කරන බව දැනගෙන හිටියා. ගයනිගේ අම්මලත් හරි සතුටෙන් හිටියේ ගයනිගේ මේ හොඳ වැඩ දිහා බලලා.

ඒ නිසාම ගයනිගේ අම්මලා පවනිට උවමනාකරන පොත්පත් වගේම ඇඳුම් කිහිපයකුත් ගයනි අතේ පාසලට යැව්වා.

පවනි පන්තියේ හොදින් වැඩ කරන

නිසා දෙන ත්‍යාගයක් විදිහට

හැමෝගෙම අත්පොලසන් මැදපවනිට


ගයනි ගෙනාව ත්‍යාග පාර්සලය

ගුරුතුමිය අතින් දුන්නා.





ඉතින් මගේ පුංචි යාලුවනේ ඔයාලත් ගයනි වගේ හොඳ ගුණධර්ම ඔයාලගේ ජීවිතයට එකතු කර ගන්න. ඒකෙන් ඔයාලට ලොකු සතුටක් වගේම අපි අවට ඉන්න අයට යහපතක් වන බව මතක තබා ගන්න.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත්ත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි.

එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල්, කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂතත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂ්නාත්මක ව සනාථ වේ. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග , සාහිත්‍ය නිර්මාණ හැකියාව තුලින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

**ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක ,**
**සෙනෙවිරත්න මහලේකම්.**

ISBN අංකය : 978-624-208-652-1